# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19
# දරන ගමනාගමන මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1978 මැයි මස 26 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1978 ජූනි මස 02 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිල: රු. 1.30 තැපැල් ගාස්තුව: ශත 50 යි

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත

[සහතිකය සටහන් කළේ 1978 මැයි මස 26 වන දින]

එල්. ඩී.—ඕ. 67/77.

ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල පිහිටුවීම සඳහා ද, ලංකා ගමනාගමන මණ්ඩලයේ බලතල, කටයුතු හා කාර්ය මෙම මණ්ඩල විසින් ක්‍රියාත්මක කරනු ලැබීම, කරනු ලැබීම හා ඉටු කරනු ලැබීම සඳහා ද, ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් ද දේපළ ද අයිතිවාසිකම් ද බැඳීම් සහ බැරකම් ද ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලයට පැවරීම සඳහා ද 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනත ඉවත් කිරීම සඳහා ද, මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා ද සම්බන්ධිත කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවීමේ දිනය.

## I වන කොටස

## ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය හා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල

**2.** (1) ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය පිහිටුවීම.

(2) (1) වන උපවගන්තියෙන් පිහිටුවනු ලබන මණ්ඩලය මේ පනතේ මින් මතු මධ්‍යම මණ්ඩලය යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

**3.** (i) මේ පනතේ I වන උපලේඛනයේ II වන තීරයේ අවිශේෂයෙන් විස්තර කරනු ලැබ ඇති සහ මේ කොටස යටතේ කරනු ලැබ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයන් මගින් සීමා නිර්ණය කරනු ලැබිය යුතු එක් එක් ප්‍රදේශය සඳහා ඒ උපලේඛනයේ I වන තීරයේ අනුරූප සටහනෙහි සඳහන් නමින් හඳුන්වනු ලැබිය යුතු මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය. ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල පිහිටුවීම.

(2) (1) වන උපවගන්තියෙන් පිහිටුවනු ලබන මණ්ඩල මේ පනතේ මින් මතු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල යනුවෙන් සඳහන් කරනු ලැබිය යුතු ය.

2—ඒ 33659—12,760 (78/01)

මධ්‍යම මණ්ඩලය සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල සංස්ථාගත මණ්ඩල විය යුතු බව.

4. මධ්‍යම මණ්ඩලය, 2 වන වගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් ද එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය, 3 වන වගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් ද සංස්ථාගත මණ්ඩලයක් විය යුතු අතර ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු ය. තව ද, ඒ නාමයෙන් මධ්‍යම මණ්ඩලය විසින් හෝ එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් නඩු පැවරීම ද ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

මධ්‍යම මණ්ඩලයේ සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල සංයුතිය.

5. (1) මධ්‍යම මණ්ඩලය—

(අ) ප්‍රවාහණය, කාර්මික ව්‍යාපාර, වාණිජ හෝ මුදල් කටයුතු පිළිබඳව හෝ පරිපාලනමය හෝ කම්කරු සම්බන්ධතා පිළිබඳව පළපුරුද්දක් ඇතැයි සහ ඒ සම්බන්ධයෙන් පරිණත භාවයක් පෙන්වා ඇතැයි අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු සභාපතිවරයකුගෙන් ද වෙනත් සාමාජිකයන් තිදෙනකුගෙන් ද ;

(ආ) එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ සභාපතිවරයාගෙන් ද ; තව ද

(ඇ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නාම කරනු ලබන, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය නිලධරයකුගෙන් ද

සමන්විත විය යුතු ය.

(2) සභාපතිවරයා හැර, (1) (අ) වන උපවගන්තිය යටතේ පත් කරන ලද සාමාජිකයන් අතුරින් එක් සාමාජිකයකු මධ්‍යම මණ්ඩලයේ උප සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(3) එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය—

(අ) ප්‍රවාහණය, කාර්මික ව්‍යාපාර, වාණිජ හෝ මුදල් කටයුතු පිළිබඳව හෝ පරිපාලනමය හෝ කම්කරු සම්බන්ධතා පිළිබඳව පළපුරුද්දක් ඇතැයි සහ ඒ සම්බන්ධයෙන් පරිණතභාවයක් පෙන්වා ඇතැයි අමාත්‍යවරයාට පෙනී යන තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු සභාපතිවරයකුගෙන් ද වෙනත් සාමාජිකයන් තිදෙනකුගෙන් ද ; තව ද

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නාම කරනු ලබන රාජ්‍ය නිලධරයකුගෙන් ද

සමන්විත විය යුතු ය.

(4) මේ පනතේ II වන උපලේඛනයේ විධිවිධාන මධ්‍යම මණ්ඩලය සහ එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය සම්බන්ධයෙන් බල පැවැත්විය යුතු ය.

6. (1) මේ පනතින් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් පිහිටුවනු ලැබූ එක් එක් ප්‍රදේශයේ සීමා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නිර්ණය කළ යුතු අතර ඒ එක් එක් ප්‍රදේශය මායිම් අනුව සඳහන් කරමින් නිර්ණය කරනු ලැබිය යුතු ය.

ප්‍රදේශ සීමා නිර්ණය කිරීම සහ වෙනස් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සීමා නිර්ණය කරන ලද ප්‍රදේශ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් කලින් කල වෙනස් කරනු ලැබිය හැකි අතර වෙනස් කරනු ලැබීමෙන් පසු, එසේ සීමා නිර්ණය කරන ලද ප්‍රදේශ මායිම් අනුව සඳහන් කිරීමෙන් ඒ නියමයෙහි විස්තර කරනු ලැබිය යුතු ය.

7. (1) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල කටයුතු සම්බන්ධීකරණය කිරීම හා ඒ මණ්ඩලවල ප්‍රතිපත්තිය පිළිබඳව පොදු පාලනයක් කිරීම සහ ඒ කාර්යය සඳහා—

මධ්‍යම මණ්ඩලයේ සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල කාර්ය.

(අ) ස්වකීය ව්‍යාපාර කටයුතුවලට හා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල ව්‍යාපාර කටයුතුවලට අදාළව ඉංජිනේරු කර්මාන්තයෙහි පුළුල් අංශයන්හි නියුක්තවීම ;

(ආ) නිෂ්පාදන සැලසුම්වල නියුක්තවීම ;

(ඇ) කාල සටහන් සම්බන්ධීකරණයෙහි නියුක්තවීම ;

(ඈ) සේවා සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණයෙහි නියුක්තවීම ;

(ඉ) මෝටර් වාහන ආනයනය කිරීමෙහි සහ මිල දී ගැනීමෙහි සහ මෝටර් වාහන සඳහා අමතර කොටස් සහ උපාංග ආනයනය කිරීමෙහි සහ මිල දී ගැනීමෙහි නියුක්තවීම ;

(ඊ) සිවිල් ඉංජිනේරු සේවාවල නියුක්තවීම ;

(උ) පොදු වශයෙන් අයවැය සකස් කිරීමෙහි සහ සැලසුම් කිරීමෙහි නියුක්තවීම ; සහ

(ඌ) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවලට කළමනාකරණය පිළිබඳ විශේෂඥයන් සහ සහාය ලබා දීමෙහි නියුක්තවීම

මධ්‍යම මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

(2) (අ) එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයට අයත් ප්‍රදේශය ඇතුළත සහ අන්තර් ප්‍රාදේශීය වශයෙන් කාර්යක්ෂම නිත්‍ය බස් සේවා සැලසීම හා එම සේවා දුම්රිය ගමනාගමන සේවය සමග හැකිතාක් දුරට සම්බන්ධීකරණය කිරීම සහ අනාවශ්‍ය සහ හානිකාරී බස් සේවා සැලසීමෙන් වැළකී සිටිනා අතර මහජනයාගේ මහා මාර්ග ප්‍රවාහණ අවශ්‍යතා ඉටුවන ආකාරයෙන් ස්වකීය ප්‍රදේශය ඇතුළත සහ අන්තර් ප්‍රාදේශීය වශයෙන් බස් සේවා ව්‍යාප්ත කිරීම සහ ඒවා වැඩිදියුණු කිරීම ;

(ආ) ජලයෙන් මඟින් ප්‍රවාහණය කිරීම සඳහා පාරු සේවා සැලසීම සහ සෑම විස්තරයකට ම අයත් බඩු ගොඩබිමින් ගෙන යාම සඳහා භාර ගැනීම ; සහ

(ඈ) මණ්ඩලයේ ආදායමට නිසි පරිදි බැර කරනු ලැබිය හැකි යම් අයකිරීම් වේ ද ඒ අයකිරීම පියවීම සඳහා ද ප්‍රමාණවත් පොදු සංචිතයක් පිහිටුවා පවත්වා ගෙන යාම සඳහා ද අවශ්‍ය ප්‍රමාණයට වඩා මණ්ඩලයේ ආදායම් අඩු නොවන බවට වග බලා ගැනීම පිණිස, මේ පනතේ විධිවිධානවලට අනුකූලව, ස්වකීය ව්‍යාපාර කටයුතු යම් ආකාරයකින් කර ගෙන යා යුත්තේ ද ඒ ආකාරයෙන් කර ගෙන යාම හා ගමන් ගාස්තු පැනවීම

එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

(3) මධ්‍යම මණ්ඩලය හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල හෝ අන්‍යාකාරයකින් යටත් නොවන, කවර හෝ ආකාරයකින් යුත් කාර්යයක් හෝ බැඳීමක් යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් ඉදිරියෙහි පැවැත්වෙන නඩු කටයුතු මගින් කෙළින් ම හෝ අන් අයුරකින් මධ්‍යම මණ්ඩලය වෙත හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල වෙත මේ වගන්තියෙහි වූ කිසිවකින් නියම වේතැයි තේරුම් නොගත යුතු ය.

මධ්‍යම මණ්ඩලයේ සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල බලතල.

8. (1) මධ්‍යම මණ්ඩලය විසින් පහත දැක්වෙන සියලුම බලතල හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :—

(i) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත් කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ii) මධ්‍යම මණ්ඩලයේ වැඩ කර ගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම ;

(iii) මණ්ඩලයේ වැඩ කටයුතු කර ගෙන යාම පිණිස අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීම සඳහා මණ්ඩලය විසින් සලසනු ලබන පහසුකම් සහ ඒ සඳහා වෙනත් තැනැත්තන් විසින් සලසනු ලබන පහසුකම්වලට සහායදීම ද ඇතුළුව, මධ්‍යම මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන තැනැත්තන්ගේ නිපුණත්වය වැඩිදියුණු කිරීමේ හෝ මණ්ඩලයේ උපකරණවල කාර්යක්ෂමතාව හෝ එම උපකරණ ක්‍රියාත්මක කරනු ලබන ආකාරය වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා ඕනෑම දෙයක් කිරීම සහ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක ඉල්ලීම පිට, ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන තැනැත්තන් සහ ඒ මණ්ඩලයේ උපකරණ සම්බන්ධයෙන් ඒ බලතල ක්‍රියාත්මක කිරීම ;

(iv) මධ්‍යම මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන තැනැත්තන් සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන තැනැත්තන් සඳහා අර්ථ සාධක අරමුදලක් පිහිටුවීම ;

(v) මධ්‍යම මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන තැනැත්තන් සඳහා සුභසාධක සහ විනෝද පහසුකම්, නිවාස, පෝෂ්‍යාසිකාගාර සහ වෙනත් එවැනි ඉඩ පහසුකම් සැලසීම ;

(vi) සෑම විස්තරයකට ම අයත් මෝටර් වාහන නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, බෙදා හැරීම හා විකිණීම සහ සෑම විස්තරයකට ම අයත් මෝටර් වාහන අමතර කොටස් නිෂ්පාදනය කිරීම, බෙදා හැරීම හා විකිණීම ;

(vii) මධ්‍යම මණ්ඩලයේ සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල ව්‍යාපාර කටයුතුවල කාර්යය සඳහා අවශ්‍ය ඕනෑම දෙයක් ඉදි කිරීම, නිෂ්පාදනය කිරීම, ආනයනය කිරීම, මිල දී ගැනීම, පවත්වා ගෙන යාම සහ අලුත්වැඩියා කිරීම ;

(viii) මධ්‍යම මණ්ඩලයේ ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා මධ්‍යම මණ්ඩලයේ යම් නිලධරයකු වෙත පැවරීම අවශ්‍ය යයි මණ්ඩලය සලකන මණ්ඩලයේ යම් කටයුත්තක් ඒ නිලධරයා වෙත පැවරීම ;

(ix) මධ්‍යම මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු ගිවිසුම්වලට, කෙළින් ම හෝ නත් කාර්ය සඳහා බලය දී ඇති යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මඟින්, එළඹීම සහ ඒ ගිවිසුම් ඉටු කිරීම ;

(x) මධ්‍යම මණ්ඩලයේ සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ගේ පාරිශ්‍රමික, විනය පාලනය, හැසිරීම සහ ඔවුන්ට නිවාඩු දීම ඇතුළුව, ඒ නිලධරයන්ට හෝ සේවකයන්ට අදාළ රීති සෑදීම ;

(xi) මධ්‍යම මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ;

(xii) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා අවශ්‍ය සියලු දේ කිරීම ;

(xiii) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවලට ඉංජිනේරු, තාක්ෂණික, නීතිමය, වෛද්‍ය සහ මුදල් ආධාර සහ උපදෙස් සැපයීම සහ ස්වකීය බලතල, කාර්ය හා කටයුතු නියි පරිදි හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම සඳහා මණ්ඩලවලට අවශ්‍ය වෙනත් යම් සහාය හෝ උපදෙස් දීම ; සහ

(xiv) මධ්‍යම මණ්ඩලයේ ව්‍යාපාර කටයුතු සහ වෙනත් කටයුතු හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක ව්‍යාපාර කටයුතු සහ වෙනත් කටයුතු නියි පරිදි කර ගෙන යාම පහසු කිරීම සඳහා, ස්වකීය මතය අනුව, අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

(2) එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් පහත දැක්වෙන සියලුම බලතල හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :—

(i) යම් චංචල හෝ නිශ්චල දේපළක් දැරීම, බද්දට ගැනීම හෝ කුලියට ගැනීම හෝ දීම සහ මධ්‍යම මණ්ඩලයේ එකඟත්වය ඇතිව, අත් කර ගැනීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ii) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ වැඩ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයෙහි නියුක්ත කිරීම ;

(iii) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ වැඩ කටයුතු කර ගෙන යාම සඳහා අවශ්‍ය තැනැත්තන් ශ්‍රී ලංකාවේ දී පුහුණු කිරීම සඳහා සහ මධ්‍යම මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ශ්‍රී ලංකාවෙන් පිටත පුහුණු කිරීම සඳහා මණ්ඩලය විසින් සලසනු ලබන පහසුකම් සහ වෙනත් තැනැත්තන් විසින් ඒ සඳහා සලසනු ලබන පහසුකම්වලට සහාය දීම ද ඇතුළුව ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන තැනැත්තන්ගේ නිපුණත්වය වැඩි දියුණු කිරීමේ හෝ මණ්ඩලයේ උපකරණවල කාර්යක්ෂමතාව හෝ එම උපකරණ ක්‍රියාත්මක කරනු ලබන ආකාරය වැඩි දියුණු කිරීමේ කාර්යය සඳහා ඕනෑම දෙයක් කිරීම ;

(iv) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන තැනැත්තන් සඳහා සුභසාධක සහ විනෝද පහසුකම්, නිවාස, නේවාසිකාගාර සහ වෙනත් එවැනි ඉඩ පහසුකම් සැලසීම ;

(v) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ ව්‍යාපාර කටයුතුවල කාර්යය සඳහා අවශ්‍ය ඕනෑම දෙයක් පවත්වා ගෙන යාම සහ අලුත්වැඩියා කිරීම ;

(vi) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ ව්‍යාපාර කටයුතුවල කාර්යය සඳහා අවශ්‍ය ඕනෑම දෙයක් මධ්‍යම මණ්ඩලයෙන් මිල දී ගැනීම සහ එසේ කිරීම අපහසු වන අවස්ථාවක, ශ්‍රී ලංකාව ඇතුළතින් මිල දී ගැනීම ;

(vii) ස්වකීය ප්‍රදේශය ඇතුළත සහ අන්තර් ප්‍රාදේශීය වශයෙන් ක්‍රමවත් සහ අවස්ථානුයෝගී වූ බස් සේවා සැලසීම සහ බස් සේවා සැලසීම කළ නොහැකි බව හෝ දුෂ්කර බව ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ මතය වන අවස්ථාවක, ඒ බස් සේවා වෙනුවට නැතහොත් වැඩි වන මඟීන්ගේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා කුලී මෝටර් රථ සේවයක් සැලසීම අවශ්‍ය බව මණ්ඩලයේ මතය වන අවස්ථාවක, ඒ බස් සේවාවට අමතරව හෝ කුලී මෝටර් රථ සේවා ඕනෑම මාර්ගයක සැලසීම;

(viii) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල මඟින් ප්‍රවාහනය කරනු ලබන මඟීන් සඳහා ආවරණ හෝ නැවතුම් ස්ථාන වැනි පහසුකම් සැලසීම ;

(ix) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල බස්, කුලී මෝටර් රථ හෝ ලොරි නතර කරන හෝ කුලියට දීම සඳහා නවත්වා තබන ස්ථාන සැලසීම සහ ඒවා පවත්වා ගෙන යාම ;

(x) ගාස්තු අයකර පුවත්පත්, තැපැල් ලියුම්, පාර්සල් හෝ වෙනත් තැපැල් භාණ්ඩ ගෙන යාම භාර ගැනීම ;

(xi) මගීන් සහ බඩු ජලයෙන් ප්‍රවාහණය කිරීම සඳහා පාරු සේවා පිහිටුවීම, පවත්වා ගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම ;

(xii) සෑම විස්තරයකට ම අයත් බඩු ගෙන යාමට භාර ගැනීම සහ ඒ කාර්යය සඳහා, යම් මෝටර් ගමනාගමන සේවයක අයිතිකරු විසින් බඩු ප්‍රවාහණය කිරීම සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කිරීමට අදහස් කරනු ලබන මුදල් නොවන යම් චංචල හෝ නිශ්චල දේපළක් මධ්‍යම මණ්ඩලයේ එකඟත්වය ඇතිව අත්කර ගැනීම හෝ බලකර ලබා ගැනීම ;

(xiii) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ යම් නිලධරයකු වෙත පැවරීම අවශ්‍ය යයි මණ්ඩලය සලකන මණ්ඩලයේ යම් කටයුත්තක් නිලධරයා වෙත පැවරීම ;

(xiv) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සියලු ගිවිසුම්වලට කෙළින් ම හෝ තත් කාර්ය සඳහා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් බලය දී ඇති යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින්, එළඹීම සහ ඒ ගිවිසුම් ඉටු කිරීම ;

(xv) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන්, මධ්‍යම මණ්ඩලයේ එකඟත්වය ඇතිව, රීති සෑදීම ; සහ

(xvi) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ ව්‍යාපාර කටයුතු සහ වෙනත් කටයුතු නිසි පරිදි කර ගෙන යාම පහසු කිරීම සඳහා, ස්වකීය මතය අනුව, අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

(3) (අ) යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක සියලුම බස් සේවා සම්බන්ධයෙන් හෝ ස්වකීය ප්‍රදේශය ඇතුළත විශේෂ ප්‍රදේශවල වූ ඒ මණ්ඩලයේ බස් සේවා සම්බන්ධයෙන් හෝ ඒ මණ්ඩලයේ යම් විශේෂ පන්තියක බස් සේවාවක් හෝ සේවා සම්බන්ධයෙන් ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් අය කරනු ලැබිය හැකි ගමන් ගාස්තු ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විමසා මධ්‍යම මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව කලින් කල නිශ්චය කරනු ලැබිය හැකි ය.

(ආ) (අ) ඡේදය යටතේ නිශ්චය කරනු ලබන ගමන් ගාස්තු ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර එහි සඳහන් කරනු ලබන දිනයක ඒවා ක්‍රියාත්මක විය යුතු ය.

(ඇ) මේ උපවගන්තියේ කාර්ය සඳහා, ''බස් සේවා'' යන යෙදුමට, බඩු ප්‍රවාහණය කිරීම සඳහා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් සලසනු ලබන යම් කුලී මෝටර් රථ සේවා, යම් පාරු සේවා හෝ බඩු [illegible] කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහණ සේවා ඇතුළත් වේ.

(4) තත් කාලයෙහි වලංගුව බලපවත්නා යම් නීතියක් මධ්‍යම මණ්ඩලය විසින් හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල විසින් හෝ නොයලකා හැරීමට (1) වන, (2) වන හා (3) වන උපවගන්තිවල විධිවිධාන කිසිවකින් බලය පැවරෙතැයි අර්ථ නිරූපණය කරනු නො ලැබිය යුතු ය.

පාරු පැවරීම.

9. (1) රේන්ද විෂයය භාර අමාත්‍යවරයා විසින් කලින් කල, (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, පහත දක්වෙන කාර්ය සඳහා නියමයන් සාදනු ලැබිය හැකි ය. එනම :—

(අ) රේන්ද ආඥාපනත යටතේ පිහිටුවන ලද යම් පාරුවකට සම්බන්ධ වූ හෝ ඒ පාරුවේ කාර්යය සඳහා අවශ්‍ය යම් චංචල දේපළක් ඒ පාරුව සමග කවර හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල යකට හෝ ඊට වැඩි මණ්ඩල ගණනකට හෝ පැවරීමේ කාර්යය සඳහා ; සහ

(ආ) ඒ පාරුව හා සම්බන්ධ, ජනරජයේ යම් ගිවිසුම හෝ වගකීම එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයකට හෝ ඊට වැඩි මණ්ඩල ගණනකට හෝ පැවරීමේ කාර්යය සඳහා.

(2) එවැනි සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එය පළ කරනු ලැබූ දිනයේ දී හෝ එම නියමයෙහි සඳහන් පසු දිනයක දී හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) ජනරජයේ කිසිම චංචල දේපළක් සහ කිසිම ගිවිසුමක් හෝ වගකීමක්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය නොමැතිව, (1) වන උපවගන්තිය යටතේ කවර හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයකට හෝ ඊට වැඩි මණ්ඩල ගණනකට හෝ පැවරීම නොකළ යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ යම් නියමයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ විට—

(අ) නියමයේ සඳහන් පාරුව සහ චංචල දේපළ ඒ නියමයේ සඳහන් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය හෝ මණ්ඩල වෙත සතු විය යුතු ය ;

(ආ) නියමයේ සඳහන් ගිවිසුම් ඒ මණ්ඩලයේ හෝ ඒ මණ්ඩලවල ගිවිසුම් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ ගිවිසුම් යටතේ වූ ජනරජයේ සියලුම අයිතිවාසිකම් සහ බැඳීම් ඒ මණ්ඩලයේ හෝ ඒ මණ්ඩලවල අයිතිවාසිකම් සහ බැඳීම් ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ඇ) නියමයේ සඳහන් යම් වගකීම් ඒ මණ්ඩලයේ හෝ ඒ මණ්ඩලවල වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

මධ්‍යම මණ්ඩලය සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය සම්බන්ධයෙන් අමාත්‍ය වරයා සතු බලය.

10. (1) ජාතික යහපත කෙරෙහි බලපාන ලෙස අමාත්‍යවරයාට පෙනී යන කාරණාවලට අදාළව, මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක හෝ කාර්ය ඉටු කිරීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ මධ්‍යම මණ්ඩලයට හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයට සාමාන්‍ය හෝ විශේෂ විධාන දෙනු ලැබිය හැකි අතර ඒ විධාන දෙනු ලැබුවේ යම් මණ්ඩලයක් වෙත ද ඒ මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් මධ්‍යම මණ්ඩලයට හෝ යම් ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩලයකට හෝ විධානයක් කරමින්, එසේ විධාන කරනු ලැබූ මණ්ඩලයේ දේපළ හා ව්‍යාපාර කටයුතු පිළිබඳ වාර්තා, ගිණුම් හා වෙනත් තොරතුරු, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ආකෘති යක ඔහු වෙත සපයන ලෙස කලින් කල විධාන කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් එවැනි සෑම විධානයක් ම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) තමා විසින් සඳහන් කරනු ලබන තැනැත්තකු හෝ තැනැත්තන් විසින් මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩලයක හෝ සියලු ම කටයුතු හෝ ඉන් කිසිවක් විමර්ශනය කොට වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර එවැනි නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය කරනු ලැබුවෙ යම් මණ්ඩලයක කටයුතු සම්බන්ධයෙන් ද ඒ මණ්ඩලය විසින් ඒ නියමය ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය සියලු කටයුතු සම්බන්ධයෙන් ද ඒ මණ්ඩලය විසින් ඒ නියමය ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය සියලු පහසුකම් සැලසීම හා සියලු තොරතුරු සැපයීම කරනු ලැබිය යුතු ය.

11. (1) ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩලවල කටයුතු සම්බන්ධි කරණය කිරිමේ සහ ඒ මණ්ඩලවල ප්‍රතිපත්තිය පිළිබඳව පොදු පාලනයක් කිරිමේ කාර්යය සඳහා අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි මධ්‍යම මණ්ඩලයට පෙනී යන සාමාන්‍ය හෝ විශේෂ විධාන මධ්‍යම මණ්ඩලය විසින් යම් ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩලයකට දෙනු ලැබිය හැකි අතර එසේ විධාන කරනු ලැබූ සෑම ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩලයක් ම විසින් ඒ විධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

*ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩල සම්බන්ධයෙන් මධ්‍යම මණ්ඩලයේ බලතල.*

(2) මධ්‍යම මණ්ඩලය විසින් නියම කරනු ලබන ආකාරයකින් සහ වේලාවල දී, සෑම ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩලයක් ම විසින් ඒ ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩලයේ දේපළ සහ කටයුතු සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා පහසුකම් මධ්‍යම මණ්ඩලයට සැලසීම ද ඒ දේපළ සහ කටයුතු සම්බන්ධයෙන් වාර්තා, ගිණුම් සහ වෙනත් තොරතුරු මධ්‍යම මණ්ඩලයට සැපයීම ද, එසේ සපයන ලද තොරතුරු සත්‍යායනය කිරිම සඳහා මධ්‍යම මණ්ඩලයට පහසුකම් සැලසීම ද කරනු ලැබිය යුතු ය.

12. (1) මධ්‍යම මණ්ඩලය සහ සෑම ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩල යක් ම විසින්, අමාත්‍යවරයා විමසා, අවස්ථාවෝචිත පරිදි, මධ්‍යම මණ්ඩලයේ හෝ ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට සාමාන්‍යාධිකාරිවරයකු පත් කරනු ලැබිය හැකි ය.

*මධ්‍යම මණ්ඩලයේ සහ ප්‍රාදේශිය ගමනාගමන මණ්ඩලවල සාමාන්‍යාධිකාරිවරයා සහ මධ්‍යම මණ්ඩලයේ ප්‍රධාන ගිණුම් නිලධරයා.*

(2) මධ්‍යම මණ්ඩලය විසින්, අමාත්‍යවරයා විමසා, මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ප්‍රධාන ගිණුම් නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය.

රාජ්‍ය නිලධරයන්, පළාත් පාලන සේවයෙහි නිලධරයන්, යම් පළාත් පාලන ආයතන යක නිලධරයන්, මධ්‍යම මණ්ඩලයේ නිලධරයන් සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල නිලධරයන් මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක කාර්ය මණ්ඩලයට පත් කිරීම.

**15.** (1) මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරනු ලැබූ අමාත්‍යවරයාගේ භාරයේ ඇති අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, අවශ්‍යතාවෝචිත පරිදි, ඒ ඉල්ලීම කරන මධ්‍යම මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට, මධ්‍යම මණ්ඩලය විසින් හෝ ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා තාවකාලික වශයෙන් පත් කිරීම හෝ එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(2) යම් රාජ්‍ය නිලධරයකු මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක හෝ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලබන අවස්ථාවක—

(අ) ඔහු ඒ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබූ වේලාවේ දී රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් නම්—

(i) ඔහු ඒ මණ්ඩලයේ සේවයෙහි නියුක්ත කරනු ලැබ ඇති අතරතුර, රාජ්‍ය ප්‍රතිපත්තිය මත වැටුප් රහිතව දෙන ලද නිවාඩු පිට රාජ්‍ය සේවයේ රාජකාරිය සඳහා නොපැමිණි ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ ව්‍යවස්ථා සංග්‍රහයේ 10 (i) වන වගන්තිය ඔහුට අදාළ විය යුතු ය ; සහ

(ii) ඔහු මණ්ඩලයේ සේවයෙහි නියුක්තව සිටින සෑම සම්පූර්ණ මාසයක් ම සඳහා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුරෙහි ඔහුට ගෙවනු ලැබිය යුතු වැටුපෙන් සියයට විසිපහක් නොඉක්මවන මුදලක් මණ්ඩලය විසින් ඔහු සම්බන්ධයෙන් මණ්ඩලයේ අරමුදලින් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලට බැර කරනු පිණිස මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ගෙවිය යුතු ය ; තව ද

(ආ) ඒ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් ඔහු පත් කරනු ලැබූ අවස්ථාවේ දී, ඔහු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙහි දායකයකුව සිටියේ නම්, ඒ මණ්ඩලයට ඔහු විසින් කරනු ලබන සේවය, ඒ ආඥාපනතේ කාර්යය සඳහා, ආණ්ඩුවට කරනු ලබන සේවයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ අනුව, ඒ ආඥාපනත යටතේ ගෙවීමට ඔහු යටත් වන දායක මුදල් ඔහු ඒ මණ්ඩලයේ සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින අතරතුර, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට නොකඩවා ගෙවිය යුතු ය. තව ද එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී ඒ මණ්ඩලයේ අරමුදල්වලින් ඔහු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට ආණ්ඩුව යටත් වන දායක මුදලට සමාන මුදලක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ උචිත ගිණුමට බැර කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ඒ මණ්ඩලය විසින් ඔහු සම්බන්ධයෙන් ගෙවනු ලැබිය යුතු ය.

(3) යම් රාජ්‍ය නිලධරයකු මධ්‍යම මණ්ඩලයේ හෝ යම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක හෝ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලබන අවස්ථාවක—

(අ) ඔහු රාජ්‍ය සේවයෙන් අස් වූ ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ආ) ඔහු ඒ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ වේලාවේ දී, රාජ්‍ය සේවයෙහි ඔහුගේ ස්ථිර තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ලෙස ප්‍රකාශ කරනු ලැබූ තනතුරක් වූයේ නම්—

(i) මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ දින අසනීපයක් හේතු කොට ගෙන රාජ්‍ය සේවයෙන් ඔහු විශ්‍රාම ගන්වනු ලැබ තිබුණි නම් ඔහුට ගෙවනු ලැබිය හැකිව තිබූ ප්‍රදානයක් ලැබීමට ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහුට සුදුසුකම් තිබිය යුතු ය ;

(ii) වයස නිසා හෝ අයහපයක් නිසා හෝ ඔහු විසින් ඒ කාර්ය මණ්ඩලයෙහි දරන ලද තනතුර අහෝසි කිරීම නිසා හෝ මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් යම් හේතුවක් නිසා හෝ ඒ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයෙහි ඔහුගේ සේවා නියුක්තිය, විශ්‍රාම ගැන්වීමෙන් අවසන් කරනු ලැබුව හොත් මිස, ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ කරන ලද එවැනි යම් ප්‍රදානයක සඳහන් මුදල් ප්‍රමාණය ඔහුට ගෙවනු නොලැබිය යුතු ය ; තව ද

(iii) ඒ මණ්ඩලයෙහි සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටින අතරතුර, ඔහුගේ මරණය සිදු වූ විට, ඒ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත් කරනු ලැබීමට පෙරාතුව ම ඔහුගේ මරණය සිදු වී නම් ඒ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ඔහු සම්බන්ධයෙන් කරනු ලැබිය හැකිව තිබූ යම් ප්‍රදානයක් ඔහු සම්බන්ධයෙන් කරනු ලැබිය හැකි ය ; තව ද

(ඇ) ඒ මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ඔහු ස්ථිර වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවේ දී, ඔහු රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල් ආඥාපනත යටතේ පිහිටුවන ලද රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායකයකුව සිටියේ නම්, ඔහු සේවයෙන් පහ කිරීමෙන් නොව, ආණ්ඩුවේ කැමැත්ත ඇතිව, ගිවිසුම අවසන් වීමෙන් ඔහු ආණ්ඩුවේ සේවය අත් හරිනු ලැබූ ලෙස ඒ ආඥා පනතේ කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය.

(4) යම නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමඟ ගිවිසුමකට එළඹ ඇති තැනැත්තකු මධ්‍යම මණ්ඩලය විසින් හෝ යම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් විසින් හෝ සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ඒ මණ්ඩලයට කරනු ලබන යම් සේවා කාලයක්, ඒ ගිවිසුමේ බැඳීම ඉටු කිරීමේ කාර්යය සඳහා, ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) (අ) මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක හෝ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ හෝ යම පළාත් පාලන ආයතනයක යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ ආයතනයේ කැමැත්ත ඇතිව, ඒ ඉල්ලීම කරන මධ්‍යම මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට මධ්‍යම මණ්ඩලය විසින් හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලයක් සඳහා තාවකාලික වශයෙන් පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව, මධ්‍යම මණ්ඩලය හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ ආයතනය එකඟ වන, විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ අයිතිවාසිකම් වලට අදාළ නියම සහ කොන්දේසි ද ඇතුළු නියම හා කොන්දේසි මත, ඒ කාර්ය මණ්ඩලයට ස්ථිර වශයෙන් පත් කරනු ලැබිය හැකි ය.

(ආ) පළාත් පාලන සේවයේ හෝ යම් පළාත් පාලන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජික යකු යටත් වන විනය පාලනයට ඔහු ද යටත් විය යුතු ය.

(6) (i) මධ්‍යම මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ මණ්ඩලයේ කැමැත්ත ඇතිව, ඒ නිලධරයා හෝ සේවකයා සේවයෙහි නියුක්ත කරනු ලැබුවේ යම් මණ්ඩලයක කාර්ය මණ්ඩලයක ද ඒ මණ්ඩලය විසින් සහ ඒ නිලධරයා හෝ සේවකයා පත් කරනු ලබන්නේ යම් මණ්ඩලයක කාර්ය මණ්ඩලයකට ද ඒ මණ්ඩලය විසින් එකඟ වනු ලබන අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළු නියම හා කොන්දේසි මත යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් හෝ පත් කරනු ලැබිය හැකි ය ;

(ii) යම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ සහ ඒ මණ්ඩලයේ කැමැත්ත ඇතිව, ඒ නිලධරයා හෝ සේවකයා සේවයෙහි නියුක්ත කරනු ලැබුවේ යම් මණ්ඩලයක කාර්ය මණ්ඩලයක ද ඒ මණ්ඩලය විසින් සහ ඒ නිලධරයා හෝ සේවකයා පත් කරනු ලබන්නේ යම් මණ්ඩලයක කාර්ය මණ්ඩලයකට ද ඒ මණ්ඩලය විසින් එකඟ වනු ලබන අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියම හා කොන්දේසි ද ඇතුළු නියම හා කොන්දේසි මත මධ්‍යම මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලික වශයෙන් හෝ ස්ථිර වශයෙන් හෝ පත් කරනු ලැබිය හැකි ය.

(7) (5) වන උපවගන්තියේ කාර්යය සඳහා "පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහා නගර සභාවක්, නගර සභාවක්, සුළු නගර සභාවක් හෝ ගම් සභාවක් අදහස් වේ.

14. මධ්‍යම මණ්ඩලයේ සහ සෑම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක ම සියලු ම නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මධ්‍යම මණ්ඩලයේ සහ සෑම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක ම නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

15. මධ්‍යම මණ්ඩලය සහ සෑම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් ම අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව, අර්ථ නිරූපණය කරනු ලැබිය යුතු ය.

මධ්‍යම මණ්ඩලය සහ සෑම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් ම අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

16. (1) මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක ව්‍යාපාර කටයුතුවල කාර්ය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීමට අවශ්‍ය වන්නා වූ ද යෝජිත අත්කර ගැනීම ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන්නාවූ ද අවස්ථාවක, ඒ දේපළ මහජන කාර්යයක් සඳහා අවශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒ දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අනිවාර්යයෙන් අත්කර ගෙන, අවස්ථාවෝචිත පරිදි, මධ්‍යම මණ්ඩලය වෙත හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය වෙත පවරනු ලැබීම කරනු ලැබිය හැකි ය.

(2) මධ්‍යම මණ්ඩලය සඳහා හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් සඳහා හෝ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සම්බන්ධයෙන් ගෙවිය යුතු යම් මුදලක්, අවස්ථාවෝචිත පරිදි, මධ්‍යම මණ්ඩලය විසින් හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් හෝ ගෙවනු ලැබිය යුතු ය.

මධ්‍යම මණ්ඩලය සඳහා හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ නිශ්චල දේපළ අත්කර ගැනීම.

17. (1) මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක ව්‍යාපාර කටයුතුවල කාර්යය සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධයෙන් විශේෂ ප්‍රදානයක් හෝ බදු දීමක් කළ හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ අනුව, ඒ මණ්ඩලවලට එම දේපළ විශේෂයෙන් දීම හෝ බදු දීම සම්බන්ධයෙන් ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක කාර්යය සඳහා රජයේ යම් චංචල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ඒ දේපළෙහි සන්තකය සහ පරිහරණය, අවස්ථාවෝචිත පරිදි, මධ්‍යම මණ්ඩලය වෙත හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය වෙත පවරා සතු කරනු ලැබිය හැකි ය.

චංචල හා නිශ්චල යන දෙවර්ගයේ ම රජයේ දේපළ මධ්‍යම මණ්ඩලයට හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයකට ලබාගත හැකි බව.

මධ්‍යම මණ්ඩලයට සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවලට ණය ගැනීමට ඇති බල තල.

**18.** (1) මධ්‍යම මණ්ඩලය විසින් සහ තත් කාර්යය සඳහා මධ්‍යම මණ්ඩලයේ අනුමතය ලබා ගැනීමෙන් පසුව යම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් විසින්, අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව හෝ ඔහු විසින් දෙන ලද යම පොදු අධිකාරයකට අදාළ නියම ප්‍රකාර, මේ පනත යටතේ වූ ස්වකීය බැඳීම් ඉටු කිරීම හෝ ස්වකීය කාර්ය කිරීම සඳහා අවශ්‍ය වන මුදල්, අවස්ථාවෝචිත පරිදි, මධ්‍යම මණ්ඩලය විසින් හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල විසින් අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් හෝ තාවකාලික වශයෙන් ණයට ගනු ලැබිය හැකි ය :

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ මධ්‍යම මණ්ඩලය විසින් හෝ යම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් විසින් ලබාගන්නා ලද යම තාවකාලික ණය සම්බන්ධයෙන් ආපසු ගෙවීමට ඇති මුදල්වල එකතුව, කිසිම අවස්ථාවක දී, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදල් ප්‍රමාණ නොඉක්මවිය යුතු ය.

(2) මධ්‍යම මණ්ඩලය විසින් සහ තත් කාර්යය සඳහා මධ්‍යම මණ්ඩලයේ අනුමතය ලබා ගැනීමෙන් පසුව යම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව දෙන ලද අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව, පහත දැක්වෙන සියලු ම කාර්ය සඳහා හෝ ඉන් යම කාර්යයක් සඳහා (1) වන උප වගන්තිය යටතේ වූ තාවකාලික ණයක් වශයෙන් හැර මුදල් ණයට ගනු ලැබිය හැකි ය :—

(අ) කාරක ප්‍රාග්ධනය ප්‍රතිපාදනය කිරීම ;

(ආ) යම ස්ථිර වැඩක් හෝ වෙනත් දෙයක් සම්බන්ධයෙන් දරන ලද යම වියදම ප්‍රාග්ධනයට නියි පරිදි වැයබර කරනු ලැබිය හැකි වේ ද ඒ ස්ථිර වැඩය හෝ වෙනත් දෙය සම්බන්ධයෙන් වූ ඒ වියදම් පියවීම සඳහා මුදල් ප්‍රතිපාදනය කිරීම ;

(ඇ) ඒ මණ්ඩලය විසින් මුදලින් ගෙවිය යුතු වන, මේ පනත යටතේ වූ යම වන්දි මුදලක් ගෙවීමේ කාර්යය සඳහා අවශ්‍ය යම මුදල් ප්‍රතිපාදනය කිරීම ;

(ඈ) ඒ මණ්ඩලය විසින් ලබාගන්නා ලද යම ණයක් ගෙවා නිදහස් කිරීම ;

(ඉ) (1) වන උපවගන්තිය යටතේ තාවකාලික වශයෙන් ණයට ගන්නා ලද යම මුදලක් ආපසු ගෙවීම ද ඇතුළුව ප්‍රාග්ධන මුදලින් නියි පරිදි යොදවනු ලැබිය හැකි වෙනත් යම කාර්යයක්.

(3) මධ්‍යම මණ්ඩලය විසින් සහ තත් කාර්යය සඳහා මධ්‍යම මණ්ඩලයේ අනුමතය ලබා ගැනීමෙන් පසුව, යම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව දෙන ලද අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව, අවස්ථානුගත කරුණු අනුව සුදුසු යයි ඒ මණ්ඩලය සලකන යම ආකාරයකින් (2) වන උපවගන්තියේ සඳහන් කාර්ය අතුරින් යම කාර්යයක් සඳහා මුදල් ණයට ගනු ලැබිය හැකි ය.

මධ්‍යම මණ්ඩලයේ මුදල් ආයෝජනය කිරීම

**19.** මධ්‍යම මණ්ඩලයේ ව්‍යාපාර කටයුතුවල කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන ඒ මණ්ඩලයේ යම මුදල්, සුදුසු යයි මණ්ඩලය කල්පනා කරන ආකාරයකින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

20. යම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක ව්‍යාපාර කටයුතුවල කාර්යය සඳහා වහාම අවශ්‍ය නොවන ඒ මණ්ඩලයේ යම මුදල්, මධ්‍යම මණ්ඩලයේ මුදල්වලට බැර කරනු ලැබිය යුතු ය. අවශ්‍ය ව්‍යාපාර කටයුතු සඳහා වහාම අවශ්‍ය නො වන්නා වූ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල මුදල්

## II වන කොටස

## මුදල්

21. (1) මධ්‍යම මණ්ඩලය විසින්— සංචිතය.

(i) මණ්ඩලයේ චංචල සහ නිශ්චල දේපළවල අගය ක්ෂයවීම පියවීම සඳහා ක්ෂය සංචිතයක් ; සහ

(ii) පොදු සංචිතයක්

පිහිටුවා, පවත්වාගෙන යා යුතු ය.

(2) සෑම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් ම විසින්—

(i) මණ්ඩලයේ චංචල සහ නිශ්චල දේපළවල අගය ක්ෂයවීම පියවීම සඳහා ක්ෂය සංචිතයක් ; සහ

(ii) පොදු සංචිතයක්

පිහිටුවා, පවත්වාගෙන යා යුතු ය.

(3) (1) වන සහ (2) වන උපවගන්තිවල සඳහන් එක් එක් සංචිතවල බැරට කලින් කල ඉදිරිපත් කළ යුතු මුදල්, අවස්ථාවෝචිත පරිදි, මධ්‍යම මණ්ඩලය විසින් සහ මධ්‍යම මණ්ඩලයේ එකඟත්වය ඇතිව ඒ එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි විය යුතු ය.

(4) මධ්‍යම මණ්ඩලයේ පොදු සංචිතය සමන්විත වන මුදල්, ඒ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යොදවනු ලැබිය යුතු ය.

(5) එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ පොදු සංචිතය සමන්විත වන මුදල්, මධ්‍යම මණ්ඩලයේ එකඟත්වය ඇතිව, ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි යොදවනු ලැබිය යුතු ය.

(6) මධ්‍යම මණ්ඩලයේ සහ එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ පොදු සංචිතයේ පරමාර්ථ—

(අ) ඒ මණ්ඩලයේ ව්‍යාපාරවල මූල්‍ය ස්ථාවරභාවය සහතික කිරීම :

(ආ) එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය සම්බන්ධයෙන් වන විට, ඒ එක් එක් මණ්ඩලය විසින් සලසා ඇති බස් සහ කුලී මෝටර් රථ සේවා, පාරු සේවා සහ බඩු ප්‍රවාහණය කිරීම සඳහා වූ මෝටර් ප්‍රවාහණ සේවා සම්බන්ධයෙන් එකී එක් එක් මණ්ඩලය විසින් අය කරනු ලබන ගාස්තුවල නිතර ඇතිවන අධික වැඩිවීම වැළැක්වීම

විය යුතු අතර පොදු සංචිතය සම්බන්ධයෙන් මධ්‍යම මණ්ඩලයේ සහ එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ බලතල ඒ අනුව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

මධ්‍යම මණ්ඩලයේ සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල ආදායම් යෙදවීම.

**22.** (1) මධ්‍යම මණ්ඩලයේ සහ සෑම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක ම ආදායම පහත දැක්වෙන ගාස්තු ගෙවීම සඳහා යොදවනු ලැබිය යුතු අතර මෙහි පහත දක්වා ඇති ප්‍රමුඛතා අනුපිළිවෙළ අනුව එසේ යොදවනු ලැබිය යුතු ය :—

(අ) අවස්ථාවෝචිත පරිදි, මධ්‍යම මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ ආදායම් ගිණුමට වැය කරනු ලැබිය හැකි වූ ද බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් වූ ද (අදාළ වන අවස්ථාවක, ක්ෂය සංචිතයට සරනු ලබන වෙන් කිරීම් ඇතුළුව) ක්‍රියාකාරී සහ ආයතන වියදම් ;

(ආ) එවැනි මණ්ඩලයක් විසින් ලබා ගන්නා ලද යම් තාවකාලික ණයක් වෙනුවෙන් වූ පොලිය ;

(ඇ) යම් නිදන් අරමුදලකට හෝ බේරුම් අරමුදලකට පවරනු ලැබිය යුතු මුදල් ; සහ

(ඈ) යම් ආක්‍රමුවේ ණයක මුල් මුදල වෙනුවෙන් වූ පොලිය සහ ඒ මුල් මුදල ආපසු ගෙවීම.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ගාස්තු ගෙවනු ලැබීමෙන් පසුව යම් වර්ෂයක දී ඉතිරිවන්නා වූ මධ්‍යම මණ්ඩලයේ සහ එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ ආදායමේ අතිරික්තය මධ්‍යම මණ්ඩලයේ සහ ඒ ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ පොදු සංචිතයට වෙන් කරනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය.

**23.** මධ්‍යම මණ්ඩලයේ සහ සෑම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක ම මුදල් වර්ෂය ලින් වර්ෂය විය යුතු ය.

1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන අදාළ කිරීම.

**24.** මේ පනතින් අන්‍යාකාරයකින් විශේෂයෙන් විධිවිධාන සලසා ඇත් නම් මිස, 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මධ්‍යම මණ්ඩලයේ සහ සෑම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක ම මුදල් පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## III වන කොටස

## අන්තර්කාලීන හා පොදු විධිවිධාන

25. නියමිත දිනයෙහි—

ලංකා ගමනාගමන මණ්ඩලයේ දේපළ, ගිවිසුම්, අයිතිවාසිකම්, බැඳීම් හා වගකීම් සහ ලංකා ගමනාගමන මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති සහ ඊට විරුද්ධව ඉදිරිපත් කරනු ලැබ ඇති විනිශ්චයට භාජනව පවත්නා නඩු හා ඉල්ලීම් සහ ලංකා ගමනාගමන මණ්ඩලයේ වාසියට හෝ ඊට විරුද්ධව ඇති ඉටු නොකරන ලද තීන්දු ප්‍රකාශ හෝ තීන්දු.

(අ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි (ලංකා ගමනාගමන මණ්ඩලයේ අරමුදල්වල ඇති මුදල් ද ඇතුළුව) ඒ මණ්ඩලයේ සියලු චංචල හා නිශ්චල දේපළ මධ්‍යම මණ්ඩලය සතු විය යුතු අතර ඒවා එහි දේපළ විය යුතු ය ;

(ආ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ලංකා ගමනාගමන මණ්ඩලයේ සියලුම ගිවිසුම් හා එකඟවීම් මධ්‍යම මණ්ඩලයේ ගිවිසුම් හා එකඟවීම් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ ගිවිසුම් හා එකඟවීම් යටතේ වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ සියලු පවත්නා අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් මධ්‍යම මණ්ඩලයේ අයිතිවාසිකම්, වගකීම් සහ බැඳීම් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) ඉවත් කරනු ලැබූ, 1957 අංක 48 දරන මෝටර් රථ ගමනාගමන පනත යටතේ ස්වකීය නිලධරයන් සහ සේවකයන් සඳහා ලංකා ගමනාගමන මණ්ඩලය විසින් පිහිටුවා, පවත්වා ගෙන යනු ලබන අර්ථසාධක අරමුදල, මධ්‍යම මණ්ඩලයේ සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල නිලධරයන් සහ සේවකයන් සඳහා මධ්‍යම මණ්ඩලය විසින් මේ පනත යටතේ පිහිටුවා, පවත්වා ගෙන යනු ලබන අර්ථසාධක අරමුදලක් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඈ) ලංකා ගමනාගමන මණ්ඩලය විසින් හෝ ඊට විරුද්ධව යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරයක පවරනු ලැබුවා වූ හෝ ඉදිරිපත් කරනු ලැබුවා වූ ද නියමිත දිනයට පෙරාතුව ම විනිශ්චයට භාජනව ඇත්තා වූ ද යම් නඩුවක්, ඉල්ලීමක් හෝ අභියාචනයක් මධ්‍යම මණ්ඩලය විසින් හෝ ඊට විරුද්ධව පවරන ලද හෝ ඉදිරිපත් කරන ලද නඩුවක්, ඉල්ලීමක් හෝ අභියාචනයක් ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඉ) ලංකා ගමනාගමන මණ්ඩලය විසින් හෝ ඊට විරුද්ධව පවරන ලද හෝ ඉදිරිපත් කරන ලද යම් නඩුවක දී, ඉල්ලීමක දී හෝ අභියාචනයක දී යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් සටහන් කරනු ලැබුවා වූ හෝ දෙනු ලැබුවා වූ ද නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි සම්පූර්ණයෙන් ම හෝ කොටසක් ඉටු නොකර ඇත්තා වූ ද යම් තීන්දු ප්‍රකාශයක් හෝ තීන්දුවක්, අවස්ථාවෝචිත පරිදි, මධ්‍යම මණ්ඩලයේ වාසියට හෝ ඊට විරුද්ධව කරන ලද තීන්දු ප්‍රකාශයක් හෝ තීන්දුවක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, තීන්දු ප්‍රකාශයක් හෝ තීන්දුවක් ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයෙහි හෝ වෙනත් යම් ප්‍රඥප්තියක හෝ වූ විධිවිධාන වලට යටත්ව, ඒ තීන්දු ප්‍රකාශ හෝ තීන්දු මධ්‍යම මණ්ඩලය විසින් හෝ ඊට විරුද්ධව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

3—ඒ 33659 78(04)

**ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවලට දේපළ පැවරීම.**

26. මේ පනතින් මධ්‍යම මණ්ඩලය සතු කරන ලද යම් දේපළක් අමාත්‍යවරයා විසින්, මධ්‍යම මණ්ඩලය විමසා, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් වෙත පවරනු ලැබිය හැකි ය. තව ද ඒ නියමයෙහි සඳහන් දින සිට හෝ එහි සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට, ඒ දේපළ, ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය වෙත සතු විය යුතු අතර ඒවා එහි දේපළ විය යුතු ය.

**ලංකා ගමනාගමන මණ්ඩලයේ නිලධරයෝ සහ සේවකයෝ.**

27. නියමිත දිනයට පෙරාතුව ම දිනයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලයේ සියලු ම නිලධරයන් හා සේවකයන් ඒ දිනයට පෙරාතුව ම ඔවුන්ට අදාළ වූ නියම හා කොන්දේසි මත ම, ඒ දිනයෙහි මධ්‍යම මණ්ඩලයේ සේවයට මාරු කරනු ලැබූ ලෙස හා ඔවුන් මධ්‍යම මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

**මධ්‍යම මණ්ඩලයේ නිලධරයන් හා සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු නිලධරයන් සහ සේවකයන් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවලට මාරු කිරීම.**

28. 27 වන වගන්තියෙන් මධ්‍යම මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු වශයෙන් සලකනු ලබන යම් තැනැත්තකු මධ්‍යම මණ්ඩලය විසින් ලියවිල්ලකින් වූ නියමයක් මගින්, ඒ නියමයේ සඳහන් කරනු ලබන දිනයක සිට, යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක සේවයට මාරුකරනු ලැබිය හැකි ය. තව ද, ඒ නිලධරයා හෝ සේවකයා මධ්‍යම මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු වීම ඒ දිනයේ සිට බලපැවැත් වෙන පරිදි අවසන් විය යුතු අතර, ඒ දිනයට පෙරාතුව ම ඒ නිලධරයාට හෝ සේවකයාට අදාළ නියම හෝ කොන්දේසි මත ම, ඔහු ඒ නියමය අදාළ වන ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ නිලධරයකු හෝ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

**ලංකා ගමනාගමන මණ්ඩලයේ හෝ මධ්‍යම මණ්ඩලය යටතේ වූ සේවා කාලය, අවස්ථාවෝචිත පරිදි, මධ්‍යම මණ්ඩලය හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය යටතේ වූ සේවා කාලයක් වශයෙන් සලකනු ලැබිය යුතු බව.**

29. මේ පනත යටතේ මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක නිලධරයකු හෝ සේවකයකු ලෙස සලකනු ලැබිය යුතු නිලධරයකු හෝ සේවකයකුගේ සේවා කාලය ගණන් බැලීමේ කාර්යය සඳහා—

(අ) නියමිත දිනයට පෙරාතුව ම ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ලංකා ගමනාගමන මණ්ඩලය යටතේ වූ සේවා කාලය මධ්‍යම මණ්ඩලය යටතේ වූ සේවාකාලයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ මධ්‍යම මණ්ඩලය යටතේ වූ සේවා කාලය සහ ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ මධ්‍යම මණ්ඩලය යටතේ වූ සේවා කාලයක් වශයෙන් සලකනු ලබන සේවා කාලය, ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය යටතේ වූ සේවා කාලයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

**නියෝග.**

30. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හා විධිවිධාන බලගැන්වීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තියෙන් පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) මේ පනතින් නියෝග සෑදීමට බලය දී ඇත්තේ හෝ නියම කර ඇත්තේ යම් කාරණයක් සම්බන්ධයෙන් ද, ඒ කාරණය සම්බන්ධයෙන් නියෝග සෑදීම ;

(ආ) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල මගින් සලසනු ලබන නිත්‍ය බස් සේවාවල සහ කුලී මෝටර් රථ සේවාවල ප්‍රමාණවත් භාවය, යෝග්‍යතාව සහ කාර්යක්ෂම භාවය පිළිබඳව ද, ඒ සේවා හා සම්බන්ධ වෙනත් යම් කාරණයක් සම්බන්ධව ද මධ්‍යම මණ්ඩලයට උපදෙස් දීම පිණිස මධ්‍යම උපදේශක කාරක සභාවක් පිහිටුවීම ;

(ඇ) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් මගින් සලසනු ලැබූ නිත්‍ය බස් සේවාවල සහ කුලී මෝටර් රථ සේවාවල ප්‍රමාණවත් භාවය, යෝග්‍යතාව සහ කාර්යක්ෂම භාවය පිළිබඳව ද, එබඳු සේවා හා සම්බන්ධ වෙනත් යම් කාරණයක් සම්බන්ධව ද, ඒ ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයට උපදෙස් දීම පිණිස එක් එක් කොට්ඨාශය සඳහා ප්‍රාදේශීය උපදේශක කාරක සභාවක් පිහිටුවීම ;

(ඈ) මධ්‍යම උපදේශක කාරක සභාවේ සහ ප්‍රාදේශීය උපදේශක කාරක සභාවල සාමාජිකයන් වෙත පාරිශ්‍රමික ගෙවීම ;

(ඉ) නිත්‍ය හා ආවස්ථික බස් සේවා සහ කුලී මෝටර් රථ සේවා සැලසීමේ කාර්යය සඳහා පරිහරණය කරනු ලබන දේපළ ද ඇතුළුව, මධ්‍යම මණ්ඩලය විසින් පරිහරණය කරනු ලබන දේපළවලට හා ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවලට අයත් දේපළවලට අලාභහානි කිරීම හෝ ඒවාට හානි කිරීම වැළැක්වීම සහ එසේ අලාභහානි කිරීම හා ඒවාට හානි කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු තැනැත්තන්ට දණ්ඩනා නියම කිරීම හා ඔවුන්ගෙන් වන්දි මුදල් අයකර ගැනීම ;

(ඊ) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල බස් රථ, කුලී මෝටර් රථ සහ ලොරි නැවැත්වීම හෝ නවතා තැබීම සඳහා ඒ මණ්ඩල විසින් සලසනු ලැබ පවත්වා ගෙන යනු ලැබූ යම් ස්ථානයකට යම් තැනැත්තන් ඇතුළත් කිරීම හෝ ඇතුළුවීම සීමා කිරීම හා ඒ ස්ථානවලට ඇතුළුවන තැනැත්තන්ගේ හැසිරීම පාලනය කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයෙහි හෝ නියෝගයෙහි සඳහන් කරනු ලබන යම් පසු දිනයක හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

වැරදි

31. (1) යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක යම් බස් රථයක, කුලී මෝටර් රථයක හෝ පාරුවක—

(අ) තමාගෙන් අයවිය යුතු ගාස්තුව ගෙවීම මගහරින ;

(ආ) තමාගේ ගමනාන්තයට පැමිණි පසු එම බස්රථයෙන්, කුලී මෝටර් රථයෙන් හෝ පාරුවෙන් ඉවත්ව යාම ඕනෑකමින් ම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින ;

(ඇ) යම් අශ්ලීල, අසභ්‍ය හෝ නුරුස්නා වචන පාවිච්චි කරන හෝ එබඳු අභිනයක් දක්වන නැතහොත් යම් තැනැත්තකුට හිරිහැර හෝ අපහාස වීමට ඉඩ ඇති යම් ආකාරයකින් හැසිරෙන ;

(ඈ) එවැනි බස් රථයක, කුලී මෝටර් රථයක හෝ පාරුවක කෙළ ගසන හෝ එහි යම් කොටසක් ඕනෑකමින් ම අපවිත්‍ර කරන ;

(ඉ) දුම්බීම තහනම් කරන දැන්වීමක් ප්‍රදර්ශනය කර ඇති එවැනි බස් රථයක හෝ කුලී මෝටර් රථයක යම් කොටසක දුම් පානය කරන හෝ යම් දල්වුණු පයිප්පයක්, සුරුට්ටුවක්, සිගැරැට්ටුවක් හෝ දුම්පානය සඳහා වූ භාණ්ඩයක් ගෙන යන ; හෝ

(ඊ) තැනැත්තන්ට හිරිහැර වීමට හෝ යම් තැනැත්තකුට හෝ දේපළකට අලාභයක් හෝ හානියක් සිදුවීමට ඉඩ ඇති යම් බෝතලයක්, දියරක් හෝ වෙනත් භාණ්ඩයක් හෝ දෙයක් එවැනි බස් රථයකින්, කුලී මෝටර් රථයකින් හෝ පාරුවකින් පිටතට විසි කරන

යම් මගියකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය :

එසේ වුව ද, යම් තැනැත්තකු විසින් තමාගෙන් අය විය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් ද සමඟ, රුපියල් විස්සක දණ්ඩනයක්, ඒ ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් දණ්ඩන ලබා ගැනීමට බලය දී ඇති ඒ මණ්ඩලයේ යම් නිලධරයකු වෙත ගෙවනු ලැබුවහොත් ඒ තැනැත්තාට විරුද්ධව (අ) ඡේදය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(2) යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක යම් බස් රථයක ගමන් කරන—

(අ) ඒ ගමන සඳහා තමා වෙත නිකුත් කරනු ලැබූ ප්‍රවේශ පත්‍රය ඒ ගමන මුළුල්ලෙහිම තමා වෙත තබා නොගන්නා ; හෝ

(ආ) ඒ ප්‍රවේශ පත්‍රය පෙන්වන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස ඒ බස් රථයේ කොන්දොස්තර විසින් හෝ ඒ වෙනුවෙන් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකු විසින් හෝ ඉල්ලා සිටිනු ලැබූ විට එසේ කිරීමට අපොහොසත් වන හෝ ප්‍රතික්ෂේප කරන

යම් මගියකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට ඒ තැනැත්තා යටත් විය යුතු ය :

එසේ වුව ද, යම් මගියකු විසින්, තමාගෙන් අය විය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් ද සමඟ, රුපියල් දෙකයි සත පනහක දණ්ඩනයක්, ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් දණ්ඩන ලබා ගැනීමට බලය දී ඇති ඒ

මණ්ඩලයේ යම් නිලධරයකු වෙත ගෙවනු ලැබුවහොත් ඒ මගියාට විරුද්ධව මේ උපවගන්තිය යටතේ වූ වරදක් සම්බන්ධයෙන් නඩු පැවරීමක් කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(3) (අ) යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් මගින් හෝ එහි බලය යටතේ නිකුත් කරනු ලැබූ යම් ප්‍රවේශ පත්‍රයක් වංචනික ලෙස පාවිච්චි කරන හෝ වෙනත් යම් තැනැත්තකුට පාවිච්චි කිරීමට ඉඩ දෙන ;

(ආ) එවැනි යම් ප්‍රවේශ පත්‍රයක් වංචනික ලෙස අනුකරණය කරන, වෙනස් කරන, විච්ඡේදනය කරන, විකෘති කරන හෝ විනාශ කරන ;

(ඇ) එවැනි යම් ප්‍රවේශ පත්‍රයක්, ඒ මණ්ඩලයේ බලය නොමැතිව විකුණන, සපයන හෝ බෙදා හරින නැතහොත් විකිණීමට, සැපයීමට හෝ බෙදාහැරීමට ඉදිරිපත් කරන ;

(ඈ) එවැනි යම් ප්‍රවේශ පත්‍රයක් යයි කියනු ලබන හෝ එලෙස පාවිච්චි කළ හැකි යමක් එවැනි බලයක් නොමැතිව මුද්‍රණය කරන ;

(ඉ) යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක යම් බස් රථයකට, කුලී මෝටර් රථයකට හෝ පාරුවකට හෝ එහි යම් උපකරණයක යම් කොටසකට හෝ ඕනෑකමින් ම අලාභහානි කරන හෝ විකෘති කරන ; හෝ

(ඊ) එවැනි බස් රථයක, කුලී මෝටර් රථයක හෝ පාරුවක හෝ එහි යම් කොටසක් හෝ එහි උපකරණ සම්බන්ධයෙන්, ඒ බස් රථයේ, කුලී මෝටර් රථයේ හෝ පාරුවේ ක්‍රියාකාරිත්වය කෙරෙහි හෝ බාධා පමුණුවන අදහසින් ඕනෑකමින් ම කිසිවක් කරන හෝ කිරීමට සලස්වන නැතහොත් යම් තැනැත්තකුට යම් තුවාලයක් හෝ අපහසුවක් සිදු කරන

යම් තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(4) අවස්ථාවෝචිත පරිදි මධ්‍යම මණ්ඩලයේ හෝ ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක බලය නොමැතිව —

(අ) යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයකට අයත් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සඳහා වූ යම් යන්ත්‍රයක් විවෘත කරන හෝ එය අනාකාරයකින් අයුතු ලෙස වෙනස් කරන හෝ එහි ක්‍රියාකාරිත්වයට බාධාකරන ; හෝ

(ආ) මධ්‍යම මණ්ඩලය විසින් හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් විසින් නිකුත් කරනු ලැබූ යම් බිල්පතක් හෝ ලදුපතක් වෙනස් කරන හෝ අයුතු ලෙස වෙනස් කරන

ඒ මධ්‍යම මණ්ඩලයේ හෝ ඒ ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ යම් නිලධරයකු හෝ සේවකයකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(5) ඒ ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය මගින් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් තම සන්තකයෙහි නොමැතිව හෝ ප්‍රවේශ පත්‍රයක් මිල දී නො ගෙන යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක යම් බස් රථයක, කුලී මෝටර් රථයක හෝ පාරුවක මගියකු ලෙස ගමන් කරන යම් තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට, රුපියල් එක් සියයක් නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය :

එසේ වුව ද යම් තැනැත්තකු විසින්, තමාගෙන් අය විය යුතු ගාස්තුව මෙන් දෙගුණයක් ද සමග රුපියල් විස්සක දණ්ඩනයක් ඒ ඒ මණ්ඩල විසින් දණ්ඩන ලබා ගැනීමට බලය දී ඇති යම් නිලධරයකු වෙත ගෙවනු ලැබුවහොත් මේ උපවගන්තියට පටහැනි වරදක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමක් කිරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

(6) මේ පනතින් හෝ නියෝග මගින් වෙනත් කිසිම දඬුවමක් සඳහා ප්‍රකාශිතව ම විධිවිධාන සලසා නොමැත්තේ මේ පනතේ යම් විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝග සම්බන්ධයෙන් ද ඒ විධිවිධාන හෝ නියෝග කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින යම් තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක වූ බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

(7) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකුට නඩු පවරනු ලැබූ අවස්ථාවක, තමා ප්‍රවේශ පත්‍රයක් මිල දී ගත් බව හෝ තම සන්තකයෙහි වලංගු අවසර පත්‍රයක් තිබූ බව ඔප්පු කිරීමේ භාරය අදාළ අවස්ථාවල දී ඔහු වෙත තිබිය යුතු ය.

(8) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝගයක් යටතේ වරදක් කිරීමට තැත් කරන යම් තැනැත්තකු ඒ වරදට වරදකරු විය යුතු ය.

වැරදි කරන්නන් සිර භාරයට ගැනීම.

**32.** ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ පටහැනිව කුමක් සඳහන් වුව ද, 31 වන වගන්තිය යටතේ දඬුවම් කරනු ලැබිය හැකි යම් වරදක් කරන යම් තැනැත්තකු ඒ වරද කරනු ලැබුවේ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් සම්බන්ධයෙන් ද ඒ මණ්ඩලයේ පරීක්ෂකවරයකුගේ තරාතිරමට නොඅඩු යම් නිලධරයකු විසින් හෝ ඒ නිලධරයා විසින් තමාගේ සහායට කැඳවනු ලැබිය හැකි වෙනත් යම් තැනැත්තකු විසින් හෝ යම් පොලිස් නිලධරයකු විසින්, යම් වරෙන්තුවක් හෝ ලිඛිත අධිකාරයක් නොමැතිව නීත්‍යනුකූලව සිර භාරයට ගනු ලැබිය හැකි අතර, එසේ සිර භාරයට ගනු ලැබූ යම් තැනැත්තකු ම—

(අ) නීතියට අනුකූලව කටයුතු කිරීම සඳහා මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට වහාම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) එසේ කළ නො හැකි අවස්ථාවක, නීතියට අනුකූලව කටයුතු කිරීම සඳහා ළඟ ම පිහිටි පොලිස් ස්ථානය භාර නිලධරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය :

එසේ වුව ද, ඒ වරද කරනු ලැබුවේ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් සම්බන්ධයෙන් ද ඒ මණ්ඩලයේ ඩිපෝවක් හෝ බස් නැවතුම් ස්ථානයක් භාර නිලධරයකුගේ තරාතිරමට නොඅඩු නිලධරයකු විසින්, ඒ තැනැත්තා විසින් ඒ නිලධරයා විධාන කරනු ලැබිය හැකි පරිදි ඇප කරුවන් ඇතිව හෝ නැතිව මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියෙහි පෙනී සිටින ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබුවහොත් හා නියම කරනු ලැබූ කල්හි එසේ පෙනී සිටින බවට බැඳුම්කරයක් ඒ තැනැත්තා විසින් ලියා අත්සන් කරනු ලැබූ විට, ඒ තැනැත්තා මුදා හරිනු ලැබිය හැකි ය.

මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් සමග ගිවිසුම්වලට එළඹීමට සමාගම්වලට ඇති බලය.

**33.** යම් සමාගමක හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක කටයුතුවලට අදාළ යම් ලිඛිත නීතියක හෝ සාධන පත්‍රයක පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ සමාගම හෝ පුද්ගල මණ්ඩලය විසින්, අවස්ථාවෝචිත පරිදි, මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක හෝ කාර්ය ඉටු කිරීමට හා බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට මධ්‍යම මණ්ඩලය හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් සමග එළඹීම හා ඒවා ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

මේ පනත යටතේ හෝ මධ්‍යම මණ්ඩලයේ හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක විධානය පිට හෝ කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**34.** (1) (අ) අවස්ථාවෝචිත පරිදි, මධ්‍යම මණ්ඩලය විසින් හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මධ්‍යම මණ්ඩලයට හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයකට හෝ විරුද්ධව ; නැතහොත්

(ආ) එවැනි මණ්ඩලයක යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් මේ පනත යටතේ හෝ ඒ මණ්ඩලයේ විධානය පිට සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) මධ්‍යම මණ්ඩලයට හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයකට හෝ විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියෙහි ගෙනෙන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ මධ්‍යම මණ්ඩලය හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් දරනු ලැබූ යම් වියදමක්, ඒ මණ්ඩලයේ අරමුදල්වලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ මණ්ඩලය වෙත ගෙවනු ලැබූ හෝ මණ්ඩලය විසින් අයකර ගනු ලැබූ යම් ගාස්තු ඒ මණ්ඩලයේ අරමුදල්වලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ අවස්ථාවෝචිත පරිදි මධ්‍යම මණ්ඩලයේ හෝ ඒ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ විධානය පිට හෝ කරනු ලැබූ හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියෙහි ඒ තැනැත්තාට විරුද්ධව ගෙනෙනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී, ඔහු විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව කරනු ලැබුවේ හෝ කරන ලදැයි කියනු ලබන්නේ සද්භාවයෙන් බව අධිකරණය තීරණය කරන්නේ නම්, ඔහු විසින් ඒ වියදම ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගනු ලැබී නම් මිස, මණ්ඩලයේ අරමුදල් වලින් ගෙවනු ලැබිය යුතු ය.

මධ්‍යම මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ සාමාජිකයකුට හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව කිසිදු රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු බව.

**35.** මධ්‍යම මණ්ඩලයට හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයකට විරුද්ධව ගෙනෙනු ලැබූ යම් නඩුවක දී මණ්ඩලයේ සාමාජිකයකුට විරුද්ධව හෝ ඔහුගේ දේපළවලට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

මෝටර් වාහන පනත සම්බන්ධයෙන් විධිවිධාන.

**36.** (1) මේ පනතේ III වන උපලේඛනයේ I වන කොටසෙහි දක්වා ඇති ආකාරයට මෝටර් වාහන පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(2) මෝටර් වාහන පනතේ පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ III වන උපලේඛනයේ II වන කොටසෙහි විධිවිධාන, ඒ විධිවිධානවල සඳහන් ඒ පනතේ යම් වගන්ති අදාළ කිරීම සම්බන්ධයෙන් බලපැවැත්විය යුතු ය.

ඉවත් කිරීම.

**37.** 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

අර්ථ නිරූපණය.

**38.** පද සම්බන්ධයෙන් අනන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස මේ පනතෙහි—

"ලංකා ගමනාගමන මණ්ඩලය" යන්නෙන්, ඉවත් කරන ලද 1957 අංක 48 දරන මෝටර් ගමනාගමන පනතින් පිහිටුවන ලද ලංකා ගමනාගමන මණ්ඩලය අදහස් වේ ;

"කුලී මෝටර් රථය" යන්නට, මෝටර් වාහන පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

"නිශ්චල දේපළ" යන්නෙන්, ඉඩම් අදහස් වන අතර, ජලයෙන්, නිවාසවලින්, ගොඩනැගිලිවලින් සහ නිවෙස්වල හා ගොඩනැගිලිවල කොටස්වලින් වැයුණු ඉඩම ද ඊට ඇතුළත් වේ;

"බස්රථය" යන්නට, මෝටර් වාහන පනතෙහි ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

3 වන වගන්තිය.

## I වන උපලේඛනය

### ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල

| I වන තීරය<br>ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ නම | II වන තීරය<br>ප්‍රදේශය පිළිබඳ විස්තරය |
|---|---|
| 1. උතුරු කොළඹ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය | ප්‍රදේශය ඇතුළත මීගමුව, ජා-ඇල, කිරිඳිවැල, නිට්ටඹුව, ගම්පහ, කඩවත, මට්ටක්කුලිය, මීතොටමුල්ල, කලංගම සහ අංගොඩ ඩිපෝ මගින් ධාවනය කරනු ලබන බස් සේවාවන් ඇතුළත් වන ප්‍රදේශය. |
| 2. දකුණු කොළඹ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය | ප්‍රදේශය ඇතුළත කළුතර, අලුත්ගම, මතුගම, හොරණ, පානදුර, කැස්බෑව, මොරටුව, රත්මලාන, අවිස්සාවෙල්ල, හෝමාගම, දැරණියගල, මහරගම සහ උඩහමුල්ල ඩිපෝ මගින් ධාවනය කරනු ලබන බස් සේවාවන් ඇතුළත් වන ප්‍රදේශය. |

I වන උපලේඛනය—(සම්බන්ධිතයි)

| I වන තීරය<br>ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ නාම | II වන තීරය<br>ප්‍රදේශය පිළිබඳ විස්තරය |
|---|---|
| 3. වයඹ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය | ප්‍රදේශය ඇතුළත දකුණු කුරුණෑගල, කෑගල්ල, මාවනැල්ල, නාරම්මල, අලව්ව, උතුරු කුරුණෑගල, වාරියපොල, නිකවැරටිය, මාහෝ, කුලියාපිටිය, හලාවත සහ පුත්තලම ඩිපෝ මඟින් ධාවනය කරනු ලබන බස් සේවාවන් ඇතුළත් වන ප්‍රදේශය. |
| 4. උතුරු මැද ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය | ප්‍රදේශය ඇතුළත අනුරාධපුර, කැබිතිගොල්ලෑව, කැකිරාව, පොළොන්නරුව, දඹුල්ල, මැදවච්චිය සහ ගල්කමුව ඩිපෝ මඟින් ධාවනය කරනු ලබන බස් සේවාවන් ඇතුළත් වන ප්‍රදේශය. |
| 5. උතුරු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය | ප්‍රදේශය ඇතුළත යාපනය, පේදුරුතුඩුව, කිලිනොච්චි, කාරයිනගර්, මුලතිව්, මන්නාරම සහ වවුනියා ඩිපෝ මඟින් ධාවනය කරනු ලබන බස් සේවාවන් ඇතුළත් වන ප්‍රදේශය. |
| 6. නැගෙනහිර ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය | ප්‍රදේශය ඇතුළත ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, කල්මුනේ, මුතූර්, අක්කරෙයිපත්තුව සහ කන්තලේ ඩිපෝ මඟින් ධාවනය කරනු ලබන බස් සේවාවන් ඇතුළත් වන ප්‍රදේශය. |
| 7. මධ්‍යම ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය | ප්‍රදේශය ඇතුළත මාතලේ, මහනුවර උතුර, පේරාදෙණිය, හසලක, මහනුවර දකුණ, යටිනුවර, ගම්පොල, හඟුරන්කෙත, [illegible], නුවරඑළිය, හැටන්, පුන්ඩලුඔය සහ නාවලපිටිය ඩිපෝ මඟින් ධාවනය කරනු ලබන බස් සේවාවන් ඇතුළත් වන ප්‍රදේශය. |
| 8. ඌව ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය | ප්‍රදේශය ඇතුළත බදුල්ල, බණ්ඩාරවෙල, මොණරාගල, කැප්පෙටිපොල, බිබිලේ, මහියංගනය, රත්නපුර, බලන්ගොඩ සහ ඇඹිලිපිටිය ඩිපෝ මඟින් ධාවනය කරනු ලබන බස් සේවාවන් ඇතුළත් වන ප්‍රදේශය. |
| 9. දකුණු ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය | ප්‍රදේශය ඇතුළත මාතර, තංගල්ල, කතරගම, අකුරැස්ස, හක්මන, ගාල්ල, අම්බලන්ගොඩ, ඇල්පිටිය සහ උඩුගම ඩිපෝ මඟින් ධාවනය කරනු ලබන බස් සේවාවන් ඇතුළත් වන ප්‍රදේශය. |

II වන උපලේඛනය 5 වන වගන්තිය.

මධ්‍යම මණ්ඩලය සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවලට අදාළ විධිවිධාන

1. යම් තැනැත්තකු, ජාතික රාජ්‍ය සභාවේ මන්ත්‍රීවරයකු නම්, මධ්‍යම මණ්ඩලයට හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයකට සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් සිටීමට හෝ නුසුදුස්සකු විය යුතු ය.

2. මධ්‍යම මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් තැනැත්තකු පත් කිරීමට පෙර, පත් කිරීමට යෝජිත මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් ඒ තැනැත්තා විසින් ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී හානිකර අන්දමින් බලපෑ හැකි යම් මුදල් හෝ වෙනත් කිසිම සම්බන්ධතාවක් ඒ තැනැත්තාට නොමැති බවට අමාත්‍යවරයා සෑහීමට පත් විය යුතු ය; තව ද, අමාත්‍යවරයා විසින් ඒ මණ්ඩලවලට පත් කරන ලද සෑම තැනැත්තකුට ම එවැනි සම්බන්ධතාවක් නොමැති බවට ද, කලින් කල, අමාත්‍යවරයා සෑහීමට පත් විය යුතු ය. එම මණ්ඩලවල සාමාජිකයකු වශයෙන් අමාත්‍යවරයා විසින් පත් කරන ලද හෝ පත් කිරීමට යෝජනා කරනු ලබන යම් තැනැත්තකු විසින්, එම වගන්තිය යටතේ ස්වකීය කාර්යය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයා සලකන යම් තොරතුරු අමාත්‍යවරයා වෙත සපයන ලෙස, අමාත්‍යවරයා විසින් ඉල්ලා සිටින කවර හෝ අවස්ථාවක එසේ සපයනු ලැබිය යුතු ය.

4—ජ 33650 (78/01)

3. මධ්‍යම මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල සාමාජිකයකු, ඔහු සාමාජිකයකු වන මණ්ඩලය ගිවිසගන්නා ලද හෝ ගිවිස ගැනීමට යෝජනා කරන ලද ගිවිසුමකට කෙළින් ම හෝ අනාකාරයකින් ඔහුගේ සම්බන්ධතාවක් ඇති අවස්ථාවක ඔහුගේ සම්බන්ධතාවේ ස්වභාවය ඔහු සාමාජිකයකු වන මණ්ඩලයේ රැස්වීමක දී එළිදරව් කරනු ලැබිය යුතු අතර ඒ එළිදරව් කිරීම මණ්ඩලයේ වාර්තාවෙහි සටහන් කළ යුතු ය. තව ද, ඒ ගිවිසුම සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට ඒ සාමාජිකයා සහභාගි නොවිය යුතු ය.

4. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් මණ්ඩලයට නම් කරන ලද සාමාජිකයන් නොවන, මධ්‍යම මණ්ඩලයේ සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයේ සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක සෑම තැනැත්තකු ම—

(අ) ඒ සාමාජිකයා පත්කරනු ලබන සාධන පත්‍රයෙහි අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන පරිදි අවුරුදු පහක් නො ඉක්මවන්නා වූ යම් කාලයක් සඳහා, 5 වන සහ 6 වන වගන්තිවල විධිවිධානවලට යටත්ව ධුරය දැරිය යුතු ය : තව ද

(ආ) නැවත පත්කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය.

5. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද සාමාජිකයන් නොවන, මධ්‍යම මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක යම් සාමාජිකයකු අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද සාමාජිකයකු ඒ අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා ඉවත් කරනු ලැබිය හැකි ය.

6. රාජ්‍ය නිලධරයකු නොවන, මධ්‍යම මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක සාමාජිකයකු විසින් ඉල්ලා අස්වීම සඳහා අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් තමා සාමාජිකයකු වන මණ්ඩලයකින් ඉල්ලා අස්විය හැකි ය.

7. මධ්‍යම මණ්ඩලයේ හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක යම් සාමාජිකයකු රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුව නිසා ඔහුට සිය ධුරයේ කාර්ය කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, ඔහු අමාත්‍යවරයා විසින් පත් කරන ලද සාමාජිකයකු නම්, ඔහු වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා සුදුසු හා නිසි තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි අතර ඔහු මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරන ලද සාමාජිකයකු නම්, ඒ අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවෙන් ක්‍රියාකිරීම සඳහා රාජ්‍ය නිලධරයකු නම් කරනු ලැබිය හැකි ය.

8. මධ්‍යම මණ්ඩලයේ සභාපතිවරයාට හෝ උපසභාපතිවරයාට නැතහොත් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක සභාපතිවරයකු රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුව නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට ඔහුට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා සුදුසු තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

9. මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට හා ප්‍රමාණයන් අනුව සහ සේවා කොන්දේසිවලට යටත්ව මධ්‍යම මණ්ඩලයේ සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලවල සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

10. මධ්‍යම මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හත් දෙනකු විය යුතු අතර ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

11. මේ උපලේඛනයේ වෙනත් විධිවිධානවලට යටත්ව, මධ්‍යම මණ්ඩලය සහ එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ස්වකීය කාර්ය පටිපාටිය විධිමත් කරගනු ලැබිය හැකි ය.

12. මධ්‍යම මණ්ඩලය සහ එක් එක් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලය විසින්, එහි සාමාජිකයන් අතර පුරප්පාඩුවක් ඇත්තේ වුව ද ක්‍රියා කරනු ලැබිය හැකි ය.

13. (1) මධ්‍යම මණ්ඩලයේ සහ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක මුද්‍රාව ඒ ඒ මණ්ඩලය භාරයේ තිබිය යුතු ය.

(2) මධ්‍යම මණ්ඩලයේ මුද්‍රාව තැබීම, ඒ මණ්ඩලයේ සභාපතිවරයා සහ මුද්‍රාව තැබීම සැබෑ බවට සහතික කිරීම සඳහා මණ්ඩලය විසින් බලය දෙන ලද මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුගේ අත්සනින්, සැබෑ බවට සහතික කළ යුතු ය.

(3) ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක මුද්‍රාව තැබීම, ඒ මණ්ඩලයේ සභාපතිවරයාගේ සහ මුද්‍රාව තැබීම සැබෑ බවට සහතික කිරීම සඳහා මණ්ඩලය විසින් බලය දෙන ලද මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුගේ අත්සනින්, සැබෑ බවට සහතික කළ යුතු ය.

## III වන උපලේඛනය

36(1) වන වගන්තිය.

## I වන කොටස

### මෝටර් වාහන පනත සංශෝධනය කිරීම

1. මෝටර් වාහන පනතේ 2 වන වගන්තිය අගට පහත දැක්වෙන අලුත් උප වගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (8) ජාතික රාජ්‍ය සභාවේ 1978 ගමනාගමන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් විසින් මෝටර් කෝච් රථයක්, කුලී මෝටර් රථයක් හෝ ලොරියක් සන්තකයේ තබා ගැනීම හෝ පාවිච්චි කිරීම, එම මෝටර් කෝච් රථය හෝ කුලී මෝටර් රථය හෝ ලොරිය ගාස්තු හෝ ප්‍රතිලාභ සඳහා මගීන් හෝ බඩු ගෙනයාම පිණිස යම් මහා මාර්ගයක ධාවනය නොකරන තාක් කල් (1) වන උපවගන්තිය කඩ නොකිරීමක් ලෙස සැලකිය යුතු ය . ".

2. මෝටර් වාහන පනතේ 25 වන වගන්තිය අගට පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (10) ජාතික රාජ්‍ය සභාවේ 1978 ගමනාගමන මණ්ඩල පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මධ්‍යම ගමනාගමන මණ්ඩලය හෝ යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් විසින් මෝටර් කෝච් රථයක්, කුලී මෝටර් රථයක් හෝ ලොරියක් සන්තකයේ තබා ගැනීම හෝ පාවිච්චි කිරීම, එම මෝටර් කෝච් රථය, කුලී මෝටර් රථය හෝ ලොරිය ගාස්තු හෝ ප්‍රතිලාභ සඳහා මගීන් හෝ බඩු ගෙනයාම පිණිස යම් මහා මාර්ගයක ධාවනය නොකරන තාක් කල් (1) වන උපවගන්තිය කඩ නොකිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය. ".

3. මෝටර් වාහන පනතේ 35 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ උපවගන්තියේ අනුරූ වගන්තියෙහි (ii) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ii) බස් රථයක රෝද පරතරය අඟල් එකසිය පණස් හතකට අඩු නොවන සහ අඟල් එකසිය අසූවකට වැඩි නොවන අවස්ථාවක, (i) වන ඡේදය යටතේ එම බස් රථය සඳහා නිශ්චය කරනු ලබන මගීන් සංඛ්‍යාව අටකින් වැඩිකළ යුතු ය. " ; සහ ද

(2) ඒ උපවගන්තියේ අනුරූ වගන්තියෙහි (iii) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

(iv) බස් රථයක රෝද පරතරය අඟල් එකසිය අසූවකට වැඩි වන අවස්ථාවක, (i) වන ඡේදය යටතේ එම බස් රථය සඳහා නිශ්චය කරනු ලබන මගීන් සංඛ්‍යාව දොළහ නොඉක්මවන සංඛ්‍යාවකින් වැඩිකළ යුතු ය.".

4. මෝටර් වාහන පනතේ 66 වන වගන්තියේ (3) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (3) 1949 දෙසැම්බර් මාසයේ දී වුවම් රථ සේවයක් සපයන ලද යම් මාර්ගයක හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි එම සභාවේ පාලන සීමාවෙන් ඇතුළත වෙනත් යම් මාර්ගයක හෝ සේවාවන් සැපයීමේ බලය දෙමින් කොළඹ මහා නගර සභාවට රථවාහන අවසර පත්‍රයක් ප්‍රදානය කිරීම හෝ එම සභාව වෙත ප්‍රදානය කරන ලද එවැනි යම් අවසර පත්‍රයක් වලංගුව පැවැත්ම, මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවල කිසිවකින් වළක්වනු නොලැබිය යුතු ය. ".

5. මෝටර් වාහන පනතේ 160 වන වගන්තියේ (3) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (3) නාවික, යුද, ගුවන් හමුදාවල හෝ පොලිසියේ කාර්ය සඳහා හෝ තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුවට හෝ ආණ්ඩුවට අයත් යම් නියමිත දෙපාර්තමේන්තුවක හෝ ජාතික රාජ්‍ය සභාවේ 1978 ගමනාගමන මණ්ඩල පනතින් පිහිටුවන ලද යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක කාර්ය සඳහා හෝ පාවිච්චි කරනු ලබන යම් මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් සම්බන්ධයෙන් වූ විට, එම මෝටර් කෝච් රථයේ හෝ ලොරියේ හෝ ගුවන් විදුලි යන්ත්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් කොමසාරිස්වරයා විසින් අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබ ඇත්නම්, මේ වගන්තිය අදාළ නොවිය යුතු ය. ".

6. මෝටර් වාහන පනතේ 160 වන වගන්තියේ (1) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) බස් රථයක කොන්දොස්තර විසින්, සෑම මගියකුට ම ඔහු ගමන් ගාස්තුව ගෙවූ විට ගමන සඳහා වූ ගමන් ගාස්තුව සහ එම මගියාගේ ගමන ආරම්භවන හෝ කෙළවරවන ස්ථානය හෝ නමින් හෝ අංකයකින් ගමන් ගාස්තු අදියර සඳහන් වන අනුක්‍රමික වශයෙන් අංක යෙදූ ප්‍රවේශ පත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය. ".

7. 239 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති ඇතුළත් කරනු ලබන අතර ඒවා මෝටර් වාහන පනතේ 239අ වන සහ 239ආ වන වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :—

"ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩල විසින් නිත්‍ය හෝ ආවස්ථික බස් සේවාවන් හෝ කුලී මෝටර් රථ සේවාවන් සැපයීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන බස් රථවලට සහ කුලී මෝටර් රථවලට රථවාහන අවසර පත්‍රවලට අදාළ විධිවිධාන අදාළ නොවිය යුතු බව.

239අ. ජාතික රාජ්‍ය සභාවේ 1978 ගමනාගමන මණ්ඩල පනත මගින් පිහිටුවන ලද ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් විසින්—

(අ) නිත්‍ය හෝ ආවස්ථික බස්රථ සේවයක් සැපයීමේ කාර්ය සඳහා පාවිච්චි කරනු ලබන යම් බස් රථයක් ; හෝ

(ආ) කුලී මෝටර් රථ සේවයක් සැපයීමේ කාර්යය සඳහා පාවිච්චි කරනු ලබන යම් කුලී මෝටර් රථයක්

සම්බන්ධයෙන් හෝ ඊට අදාළව රථවාහන අවසර පත්‍ර සම්බන්ධයෙන් වූ මේ පනතේ විධිවිධාන අදාළ නොවිය යුතු අතර ඒ අනුව එවැනි යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් එවැනි බස් රථයක අයිතිකරු වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා එවැනි බස් රථයක් සම්බන්ධයෙන් වූ ආදායම් බලපත්‍රයක් ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා හෝ එවැනි බස් රථයක් යම් මාර්ගයක ධාවනය කරවීම සඳහා හෝ එවැනි බස්රථයක් හා සම්බන්ධ තවත් හෝ වෙනත් යම් කාර්යයක් සඳහා කිසිම රථවාහන අවසර පත්‍රයක් අවශ්‍ය නොවිය යුතු ය.

නිත්‍ය බස් රථ සේවාවන් සඳහා රථවාහන අවසර පත්‍ර ප්‍රදානය කිරීම නතර කිරීම.

239ආ. මේ පනතේ වෙනත් යම් විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, නිත්‍ය බස් රථ සේවයක් සඳහා රථ වාහන අවසර පත්‍රයක් කිසිදු තැනැත්තකුට ප්‍රදානය නොකළ යුතු ය.".

## II වන කොටස

30(2) වන වගන්තිය.

### මෝටර් වාහන පනතේ ඇතැම් වගන්ති අදාළවීම පිළිබඳ වූ විධිවිධාන

1. යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක යම් බස් රථයක්, කුලී මෝටර් රථයක් නැතහොත් ලොරියක් සම්බන්ධයෙන් හෝ ඊට අදාළව මෝටර් වාහන පනතේ 169 වන සහ 170 වන වගන්ති අදාළ නොවිය යුතු ය.

2. යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක යම් කුලී මෝටර් රථයක් සම්බන්ධයෙන් හෝ ඊට අදාළව මෝටර් වාහන පනතේ 171 වන සහ 172 වන වගන්ති අදාළ නොවිය යුතු ය.

3. (1) යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක යම් බස්රථයක් සම්බන්ධයෙන් හෝ ඊට අදාළව මෝටර් වාහන පනතේ 173 වන, 183 වන, 186 (2) වන සහ 190 (1) (ඉ) වන වගන්ති අදාළ නොවිය යුතු ය.

(2) යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක යම් බස් රථයක් නැතහොත් කුලී මෝටර් රථයක් සම්බන්ධයෙන් හෝ ඊට අදාළව මෝටර් වාහන පනතේ 174 වන සහ 182 වන වගන්ති අදාළ නොවිය යුතු ය.

(3) බස් රථ, කුලී මෝටර් රථ හෝ ලොරි කුලියට දීම සඳහා නතර කරනු ලබන හෝ නවතා තබනු ලබන ස්ථානයක් වශයෙන් යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් විසින් සපයනු ලබන්නා වූ සහ නඩත්තු කරනු ලබන්නා වූ යම් ස්ථානයක් සම්බන්ධයෙන් හෝ ඊට අදාළව මෝටර් වාහන පනතේ 190 (1) (ඊ) වන වගන්තිය අදාළ නොවිය යුතු ය.

(4) යම් ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයක් සම්බන්ධයෙන් හෝ ඊට අදාළව මෝටර් වාහන පනතේ 190 (1) (උ) වන වගන්තිය අදාළ නොවිය යුතු ය.

6 - ජී 33659 (78/01)